**ශීර්ෂය - 276 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙමෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිළධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක ඇතිබව

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වියදම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනයේ වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි (ACA - 2 වැඩසටහන අංක 01 හි) මුදල් රෙගුලාසි 66/69 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීම රු.8,195,000 ක් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2019 දෙසැම්බර් මස 31 දිනට ඉදිරිපත් කරන ලද වියදම් වාර්තාව අනුව එම වටිනාකම රු.5,495,000 ක් ලෙස දක්වා තිබීමෙන් ශේෂ අතර රු.2,700,000 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | නිවැරදි තොරතුරු පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුය. | 2019 අගෝස්තු 27 දින ලැබී තිබුණු රු.2,700,000 ක ප්‍රතිපාදන වියදම් වාර්තාවේ ඇතුලත් කර නොමැති බවත් නිවැරදි අගය රු.8,195,000 බවත් දන්වා ඇත. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත ආකෘති අංක SA 12 අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත බල අංක SO 392 හා SO 727 යටතේ සලසා තිබුණු රු.12,700,000 ක පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 2 (i) ආකෘතියෙහි මුදල් රෙගුලාසි 66 හා 69 අනුව මාරුකිරීම් වලින් ලද ප්‍රතිපාදන ලෙසට දක්වා තිබුණි. | තොරතුරු නිවැරදි වර්ගීකරණයකින් යුතුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කල යුතුය. | එම මුදල පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොවන බවත් මුදල් රෙගුලාසි 69 යටතේ ලබාගත් ප්‍රතිපාදනයක් බවත් දන්වා ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම | | |
| (i) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත | 2018 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ ශේෂය එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී රු.20,485,690 කින් අඩුවෙන් දක්වා තිබුණි. | සටහනෙහි ඇතුලත් අගයන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් අගයන් සමග එකඟ විය යුතුය. | බැවින් එය නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන බව දන්වා ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව රු.25,243,366 ක් වූ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂය එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ අනාවරණය කර නොතිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව නිවැරදි සංඛ්‍යාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කල යුතුය. | 2018 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් බැවින් එය නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන බව දන්වා ඇත. |
| **(ආ)** | ශුද්ධ වත්කම්<br>--------------- | | |
| | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(v) ඡේදය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් වටිනාකම රු.(170,223,414) ක් විය යුතු වුවද එය රු.(163,011,731) ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි සංඛ්‍යාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් යටතේ ඇතුලත් කර ඇති රු.(163,011,731) ක අගය රු.(173,130,663) ක් විය යුතු බව දන්වා ඇත. |
| **(ඇ)** | අග්‍රිම ගිණුම<br>-------------- | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව නොපියවූ අග්‍රිම ශේෂය රු.2,907,249 ක් වූ අතර මැතිවරණ කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරන ලද එම මුදල 2020 අප්‍රේල් 30 දින වන විටත් මැතිවරණ කාර්යාලයෙන් පියවාගෙන අග්‍රිම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම ශේෂය එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේද අනාවරණය කර නොතිබුණි. | නොපියවූ අග්‍රිම ශේෂය ප්‍රමාදයකින් තොරව භාණ්ඩාගාරය වෙත පියවීමට කටයුතු කල යුතු අතර එය මැතිවරණ කාර්යාලය වෙතින් පියවාගත යුතු ශේෂයක් බැවින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ අනාවරණය කල යුතුය. | මැතිවරණ කොමසාරිස් විසින් සෘජු ගිණුම්ගත කිරීමක් සිදු කර ඇති බවද අදාල අග්‍රිමය මැයි මස පියවීමට කටයුතු කරන බවද දන්වා ඇත.<br>එම ශේෂය අග්‍රිම ශේෂයක් මිස මුදල් ශේෂයක් නොවන බැවින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ අනාවරණය නොකල බව දන්වා ඇත. |

**(ඇ)** මූල්‍ය නොවන වත්කම්

| | | | |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත ආකෘති අංක SA 82 අනුව ශීර්ෂය 276 ට අදාලව සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් වල මුළු මිලදී ගැනීම් වටිනාකම රු.87,527,034 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.88,258,126 ක් ලෙසට දක්වා තිබීම හේතුවෙන් ශේෂයන් අතර රු.731,092 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීමට අදාල වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. | පරිගණක වැඩසටහනට ඇතුලත් කිරීමේදී ඇති වූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් මෙම වෙනස සිදුවී ඇති බව දන්වා ඇත. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශයෙහි වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ වූ විෂයයන් 06 ක ආරම්භක, මිලදි ගැනීම් හා විකුණුම්/ අපහරණයන්ට අදාල ශේෂයන් භාණ්ඩාගාර මුද්‍රිත ආකෘති අංක SA 82 හි දක්වා ඇති ශේෂයන් සමඟ නොසැසඳෙන අවස්ථා නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයන්ගේ ඇතුලත් ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ශේෂයන් සමග එකඟ විය යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අදාල ආරම්භක ශේෂ, මිලදී ගැනීම්, අපහරණයන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයන්ට ඇතුලත් නොවීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇති බව දන්වා ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගෙවීම හා අත්තිකාරම් අයකර ගැනීමට අදාලව පිලිවෙලින් රු.64,742,577 ක හා රු.46,857,884 ක ශේෂයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අනාවරණය කර නොතිබුණි. | විස්තරාත්මක ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි ඇතුලත් අත්තිකාරම් ගෙවීම් හා අත්තිකාරම් අයකර ගැනීමට අදාල අගයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අනාවරණය කල යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අනාවරණය කර ඇත්තේ කුලී හා වැඩ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් බව දන්වා ඇත. |

## 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කර රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පලාත් සභාවේ ආයතන සඳහා ස්ථාන මාරුවීම් ලබා ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල හා සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු එහෙත් අයනොවි වර්ෂ 03 ක් ඉක්මවූ රජයේ නිලධාරීන්ට ලබාදුන් රු.918,552 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරන බව දන්වා ඇත. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| XIX වැනි පරිච්ඡේදයේ 5.6 ඡේදය | - | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 02 ක් සඳහා නිලධාරින්ගෙන් ආර්ථික කුලියක් අයකිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.6 ඡේදය අනුව කටයුතු කල යුතුය | ආර්ථික කුලිය අයකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා තක්සේරු වාර්තා ලේකම්වරයා වෙත යොමුකර ඇති බවත් ඉදිරියේදී ආර්ථික කුලිය අයකිරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 08/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 3,880,321 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් අවස්ථා 37 කදී **චක්‍රලේඛ විධිවිධාන** වලට අනුකූල නොවී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. | 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 08/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව වාරික ලෙස අයකර ගනිමින් පවතින බව දන්වා ඇත. |
| (ඇ) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝබර් 15 දිනැති අංක NSE/EL/01/2018 දරන චක්‍රලේඛය | 47,500 | දීමනාලාභීන්ගේ මියයෑම් සම්බන්ධව තොරතුරු විධිමත් පරිදි ලේඛනගත කර නොතිබීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් දීමනාලාභීන්ගේ මරණයෙන් පසුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාලව ඔවුන්ගේ නියෝජිතයන්ට අවස්ථා 25 කදී වැඩිපුර දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ 2.5 සහ 2.6 ඡේද ප්‍රකාරව කටයුතු කල යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කරන බවත් මින් ඉදිරියට එවැනි දෑ සිදු නොවීමට ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන බවත් දන්වා ඇත. |
| | 146,300 | දීමනාලාභීන්ගේ මියයෑම්, වෙනත් හේතූන් මත දීමනා ක්‍රමයෙන් ඉවත් කිරීම් ආදී තොරතුරු විධිමත් පරිදි ලේඛනගත නොකිරීම හා දත්ත පද්ධතිය ක්‍රමානුකූලව පවත්වාගෙන නොයාම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව පොරොත්තු ලේඛනගත දීමනාලාභීන් වෙත ලබාදිය හැකිව තිබුණු දීමනා මුදල් නැවත එම වැය විෂයටම බැර කර තිබුණි. | චක්‍රලේඛයේ 2.5 සහ 2.6 ඡේද ප්‍රකාරව කටයුතු කල යුතුය. | මියයාම් පිලිබඳව තොරතුරු කඩිනමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලබාදෙන ලෙස ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇති බවත් ඉදිරියේදී මෙම කරුණ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන බවත් දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 136,800 | දීමනාලාභීන්ට හිමි දීමනා ඔහුගේ නියෝජිතයන්ට ගෙවීමේදී ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහ ප්‍රාදේශීය ලේකම් අනුමැතිය රහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ගෙවීම් සිදුකර තිබුණි. | චක්‍රලේඛයේ 2.1.3 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. | නම් කර ඇති නියෝජිතයන්ට පමණක් ගෙවීම් සිදු කරන ලෙස තැපැල් කාර්යාල ඇනුවත් කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදෙස්මාලාව- iv හි 2.6 ඡේදය. | 1,012,410 | 2012 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාළ ප්‍රතිලාභීන් 147 දෙනෙකුගෙන් ලැබිය යුතු ණය මුදල් නියමිත දිනට අයකරගෙන නොතිබුණි. | නියමිත දිනට ණය මුදල් අයකර ගත යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| **ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2019** | | |
| (අ) ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ජල ටැංකිය සහ ජල මෝටරය මිලදී ගැනීමේ හා ප්‍රවාහනය කිරීමේ පිරිවැයට සියයට 20 ක ලාභයක් ඇතුලත් කර ගෙවීම් කිරීම හේතුවෙන් කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.32,300 ක් වැඩිපුර ගෙවා තිබුණි. | භාණ්ඩ හා සේවා සැපයුම් ලබා ගැනීමේදී නියමිත මුදල පමණක් ගෙවිය යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල රැඳවුම් මුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතියක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු රු.23,136 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | අයකර ගත යුතු ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. | සියළු ප්‍රමාද ගාස්තු රැඳවුම් මුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | ව්‍යාපෘතියේ පස් පිරවීම සමඟ තද කිරීමේ කාර්යයට(earth filling with compacting) අදාල රේටය වෙනුවට ඊට අදාල නොවන වෙනත් රේටයක් අනුව ගෙවීම් කිරීම හේතුවෙන් කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකර තිබුණු ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.73,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත රේට අනුව ගෙවීම් කළ යුතුය. | වැඩිපුර ගෙවා ඇති රු.73,500 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඈ) | මාර්ගයේ පස් කැපීමේ කාර්යය සහ කොන්ක්‍රීට් යොදනු ලබන කොටසේ පස් කපා සැකසීමේ කාර්යය සඳහාද එකම රේටයක් භාවිතා කල හැකිව තිබියදී (E 1 - 027) ඒ සඳහා වෙනත් රේටයක් (E 1 -005) භාවිත කිරීම හේතුවෙන් හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකර තිබුණු ව්‍යාපෘතීන් දෙකකට අදාලව රු.53,135 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | නියමිත රේට අනුව ගෙවීම් කළ යුතුය. | පස් සහිත මාර්ග කොන්ක්‍රීට් කරනු ලබන්නේ කාලයක් සුසංහසනය වීමෙන් අනතුරුව බවත්, මෙම පස් සහිත මාර්ග කොන්ක්‍රීට් කිරීමට පෙර සෝදාගිය මාර්ගතලය මට්ටම් කර හොඳින් සුසංහසනය වූ පාදමක් ඉදිකර ඒ මත කොන්ක්‍රීට් ඇතිරීම සඳහා මෙම රේටය යොදාගෙන ඇති බවත් දන්වා ඇත. |

**2.2 තැන්පතු ශේෂයන්**

තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අදාල එකතුව රු. 274,940 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. | විගණන විමසුමකට අදාල කටයුතු අවසන් නොවීම හේතුවෙන් තැන්පතු රඳවාගෙන ඇති බව දන්වා ඇත. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි හා කාර්යාල විසින් විවිධ කාර්යයන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට ලබා දී තිබුණු එකතුව රු.1,907,806 ක් වූ තැන්පතු 32 ක ප්‍රතිපාදන අදාල කාර්යභාර්ය ඉටු නොකර තැන්පත් ගිණුමේම රඳවාගෙන තිබුණි. | ප්‍රතිපාදන ලද විගස අදාල කාර්යයන් ඉටුකිරීමට කටයුතු කල යුතුය. | මුදල් වෙන් කරන ලද අදාල කාර්යයන් නිම නොකිරීම හේතුවෙන් තැත්පත් ගිණුමේ මෙම මුදල් රඳවාගෙන ඇති බව දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.3,971,540 ක් සහ රු.3,647,972 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු ව්‍යාපෘතින් 02 ක් ඉටුකිරීම, අදාල කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර තිබුණු අතර එම ව්‍යාපෘතීන්ට අදාල රු.198,577 ක් හා රු.182,399 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණ මඟින් අයවිය යුතු මුදල් රජයට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත කාලසීමාව තුලදී ව්‍යාපෘති නිමකර ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කල යුතු අතර රජයට අයවිය යුතු මුදල් අය කර ගැනීමටද කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් සැලසුම් අංශයෙන් තොරතුරු ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. (නැවත පිලිතුරු සැපයීමේදී මුදලක් අයකර ගත් බව දන්වා තිබුණද එය නිරීක්ෂණයට අදාල මුදල නොවන බව නිරීක්ෂණය විය.) |

**3.2** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,213,981 ක වටිනාකමකට 2019 දෙසැම්බර් 25 වන දින නිමකිරීමට අදාල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග එකඟ වී තිබුණු අතර එහෙත් එම ව්‍යාපෘතිය 2020 පෙබරවාරි මස 19 වන දින වන විටද නිම කර නොතිබුණි. | අපේක්ෂිත කාලසීමාව තුලදී ව්‍යාපෘති නිමකර ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කල යුතුය. | මෙම ව්‍යාපෘති සඳහා 2020 වර්ෂයට අවිච්ඡේද අනුමත කරදෙන ලෙසත් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙසත් ක්‍රීඩා අමාත්‍යංශය වෙතින් ඉල්ලීමක් සිදු කලද ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. |
| (ආ) | රු.8,558,311 ක වටිනාකමකට 2019 නොවැම්බර් 07 දින නිමකිරීමට අදාල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග එකඟ වී තිබුණු අතර එම ව්‍යාපෘතිය 2020 පෙබරවාරි මස 19 වන දින වන විටත් නිමකර නොතිබුණු අතර එම දිනය දක්වා පමණක් වන රු.445,032 ක ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත කාලසීමාව තුලදී ව්‍යාපෘති නිමකර ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කල යුතු අතර අයකර ගත යුතු මුදල් අයකර ගත යුතුය. | අයහපත් කාලගුණික තත්ත්වය සහ ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි කාලය දීර්ඝ කිරීමට සිදුවූ බවත් විධිමත් පරිදි කාලය දීර්ඝ කිරීමේ කටයුතු සිදුකර ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කරන බවත් දන්වා ඇත. |
| (ඇ) | පස්සර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2019 ඔක්තෝබර් 29 වන දින ගිවිසුමකට එළඹ දින 48 ක් තුලදී නිම කිරීමට අදාල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවකු සමඟ එකඟ වී තිබුණු රු.3,605,926 ක ව්‍යාපෘතිය 2020 පෙබරවාරි මස 20 වන දින වන විටත් නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂිත කාලසීමාව තුලදී ව්‍යාපෘති නිමකර ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කල යුතුය. | මෙම ව්‍යාපෘති සඳහා 2020 වර්ෂයට අවිච්ඡේද අනුමත කරදෙන ලෙසත් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙසත් ක්‍රීඩා අමාත්‍යංශය වෙතින් ඉල්ලීමක් සිදු කලද ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.73,462 ක් වැයකර ඉටුකර තිබුණු ව්‍යාපෘතියක් අදාල ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් ඉටුනොකිරීම හේතුවෙන් භාවිතයට නොගෙන අත්හැර දමා තිබුණි. | ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අරමුණු නිසි පරිදි හඳුනාගෙන එම අරමුණු ඉටුවන අයුරින් ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය. | මාර්ගයේ අවසන් කොටස පස් කපා ඉදිකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුව පිළියෙල කර ඒ අනුව කටයුතු කරන ලද්දේ පළමු පියවර වශයෙන් බවත් ඉදිරියේදී මාර්ග සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන යටතේ මෙම මාර්ගය තවදුරටත් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම**<br>භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගේ අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛය අනුව රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා වාහන අයිතිය පිළිබඳව පවතින ගැටළු 2018 ජූනි 30 දිනට ප්‍රථම නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වුවද සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් යතුරු පැදියක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ අනුව ලියාපදිංචි අයිතිය පිළිබඳ පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීමට පියවර ගත යුතුය. | ප්‍රාදේශීය ලේකම් වෙත යතුරු පැදියේ අයිතිය පවරා ගැනීමේ මූලික කටයුතු සිදුවෙමින් පවතින බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වත්කම්වල නඩත්තුව හා අළුත්වැඩියා සිදු නොකිරීම.<br>-------------------------------------------- | | |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් කැබ් රථයක අලුත්වැඩියා කටයුතු කරගන්නා ලෙස මෝටර් රථ පරීක්ෂක විසින් දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අලුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. | වත්කම්වල අලුත්වැඩියාව ඉක්මන් කල යුතුය. | අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වූ බවත් ප්‍රතිපාදන ලද පසු අදාල කටයුතු සිදු කරන බවත් දන්වා ඇත. |
| (ඇ) | නිෂ්කාර්ය වත්කම්<br>-------------------- | | |
| | ආයතනයේ නිලධාරීන් විසින් නිවාස පහසුකම් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර තිබියදීත් එම ඉල්ලීම් සලකා බැලීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් රජයේ නිවාසයක් වර්ෂ 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට නිලධාරීන් එකඟ නොවීම හේතුවෙන් නිල නිවාසය නිෂ්කාර්යව පවතින බව දන්වා ඇත. |

### 3.5 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- |
|---|---|---|---|
| (අ) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ත් මාස 05 ක් ගතවී තිබුණ ද රු.6,349,333 ක් වූ අලාභය පියවා ගැනීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කල යුතුය. | නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කර අලාභ හානිය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2018 අගෝස්තු 21 දින අනතුරට ලක් වී තිබුණු අතර එම අනතුරෙන් රු.4,291,270 ක අලාභ හානියක් සිදු වී තිබුණි. එම අලාභ හානියෙන් රු.2,988,693 ක් අදාල රක්ෂණ සමාගමෙන් අයකරගෙන තිබුණු අතර රු.1,302,576 ක් වූ ඉතිරි අලාභය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලාභ හානිය සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | අලාභ හානියෙන් රු. 2,988,693 ක් රක්ෂණයෙන් පියවාගත් බවත් රක්ෂණයෙන් ලැබෙන මුදල 2018 දෙසැම්බර් 31 දිනට පෙර නිශ්චිතව හඳුනාගත නොහැකි වූ බැවින් එම වර්ෂයේ ප්‍රතිපාදන වලින් රු. 2,144,000 ක් පොදු තැන්පත් ගිණුමට මාරු කල බවත් එම මුදලින් රු. 1,302,576 ක අලුත්වැඩියා වියදම පියවා ඉතිරි රු. 841,423 රාජ්‍ය ආදායමට බැර කල බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින බදුල්ල දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණද එම අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | මූලික පරීක්ෂණ පවත්වා මුදල් රෙගුලාසි අනුව අදාල කටයුතු කල යුතුය. | නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කල බවත් ඒ අනුව කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් දන්වා ඇත. |
| (ඈ) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුවේ යතුර අස්ථානගත වීම හේතුවෙන් සිදු වී තිබුණු රු.29,700 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයෙන් අලාභ හානිය පියවාගෙන ගොනුවේ කටයුතු අවසන් කල යුතුය. | නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කල බවත් ඒ අනුව කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වා ඇත. |
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සිදු වී ඇති පාඩු හා හානි 07 ක් සම්බන්ධයෙන් ගණනය කර තිබුණු අලාභය රු.1,567,548 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කෙරෙන බවත් නීතිමය ක්‍රියාමාර්ග මඟින් අයකර ගැනීමට කටයුතු කරන බවත් රක්ෂණයෙන් අයකර ගැනීම් සිදු කල බවත් නැවත පරීක්ෂණ මණ්ඩල පත්කර අදාල කටයුතු සිදුකරන බවත් සහ මුදල් රෙගුලාසි 109 යටතේ කටයුතු කරන බවත් දන්වා ඇත. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------------- |
| (අ) | විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේදී වැටුප ගණනය කිරීමට අදාලව කලින් කලට වෙනස් වීමට භාජනය වන නීති රීති, චක්‍රලේඛ, උපදෙස් ලිපි පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හා ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාලව විශ්‍රාමිකයින් 114 දෙනෙකුට රු.12,150,749 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | නිවැරදිව විශ්‍රාම වැටුප ගණනය කල යුතු අතර වැඩිපුර ගෙවීම් අය කර ගත යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව අයවෙමින් පවතින බව වාර්තා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්‍රාමිකයෙක් මියගිය වහාම ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීම ග්‍රාම නිලධාරිගේ වගකීම වුවද මියයාම් නිසි පරිදි වාර්තා නොවීම හේතුවෙන් බදුලුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් දෙදෙනෙකුට රු. 109,894 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විශ්‍රාමිකයෙක් මියගිය වහාම ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමට ග්‍රාම නිලධාරීන් දැනුවත් කලයුතු අතර රාජකාරි පැහැර හරින නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | වැඩිපුර ගෙවන ලද මුදල් ලැබුණු පසු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන බව දන්වා ඇත. |
| (ඇ) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාම වැටුප්ලාභියෙකු වෙත වෙනත් දිමනාව වශයෙන් රු.88,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර විශ්‍රාම වැටුප්ලාභියා නැවත විවාහ වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම නතර කර තිබුණි. එම හේතුවෙන් 2018 දෙසැම්බර් සිට 2019 මැයි මාසය දක්වා අයවිය යුතු රු.24,000 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවීමක් සිදුනොවන ආකාරයට විශ්‍රාම වැටුප ගෙවීම් කළ යුතුය. | ලේඛන සම්පූර්ණ කර භාරදීමේ දී සිදුවූ ප්‍රමාදයක් හේතුවෙන් අයකිරීම් ප්‍රමාද වී ඇති බව දන්වා ඇත. |
| (ඈ) | මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 03 කට අදාලව හිඟ ජල ගාස්තු සහ නැවත ජල සැපයුම ලබාගැනීමේ ගාස්තු වශයෙන් රු. 73,282 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවිය යුතුව පැවතුණි. | හිඟ ජල ගාස්තු අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් විධිමත්ව අයකර ගෙන අදාල බිල්පත් කාලීනව පියවීමට කටයුතු කල යුතුය. | හිඟ මුදල් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත් පදිංචියට නුසුදුසු නිල නිවාසයේ ජල සැපයුම විසන්ධි කර ගැනීමටත් හිඟ ජල බිල්පත් පිළිබඳ ජල සම්පාදන මණ්ඩලයෙන් විමසීම් කිරීමටත් කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඉ) | සමෘද්ධි ණය වැඩසටහන්<br>--------------------------- | | |
| | (i) දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත විවිධ ණය වැඩසටහන් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාලව ණයලාභීන් 1460 කට ලබා දි තිබුණු රු.42,580,338 ක ණය මුදල නියමිත දිනට අයකර ගෙන නොතිබුණි. | ණය මුදල් නියමිත කාලය තුල දී අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ණය මුදල් අයකර ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | දිවිනැගුම දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාලව විවිධ ණය වැඩසටහන් යටතේ ප්‍රතිලාභීන් 554 ක් වෙත නිදහස් කර තිබුණු එකතුව රු.16,728,030 ක් වූ ණය මුදල් නියමිත දිනට අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ණය බොල්ණය බවට පත් වී තිබුණි. | නියමිත කාලය තුල ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ණය මුදල් අයකර ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |